........................................................................

(*c*) කෙළවරක් වැසූ අනුනාද නලයක එහි මූලික ස්වරයෙන් කම්පනය වේ. පහත රූපසටහන් භාවිතා කර නලය දිගේ ඇති වන විස්ථාපන විස්ථාරය හා පීඩන විස්ථාරය දක්වා නම් කරන්න.



(*d*) (i) වාතයේ ධ්වනි ප්‍රවේගය හා නලයේ ආන්ත දෝශය සෙවීම සඳහා ශිෂ්‍යාවක් 80 cm ක් දිග දෙකෙලවරම විවෘත නලයක් ගෙන ජල භාජනයක් තුළ සම්පූර්ණයෙන්ම ගිල්වා සිරස්ව රඳවන ලදී. නලයට සිරස්ව ඉහළින් 512 Hz වන සරසුලක් කම්පනය කර තබා භාජනය තුළ ජල මට්ටම සෙමෙන් අඩුවීමට සලසන ලදී. මෙසේ ක්‍රමයෙන් ජල මට්ටම අඩු වීමේ දී වා කඳ දිග 15 cm වන විට පළමුවරට තීව්‍ර ශබ්දයක් ඇසුණි. එසේ වීමට හේතුව කුමක් ද?

........................................................................................................................

(ii) එවිට නලය තුළ ඇතිවන තරංග වර්ගය කුමක් ද?

........................................................................................................................

(iii) මෙම අවස්ථාව සඳහා තරංග ආයාමය ($\lambda$) හා වා කදේ දිග ($l$) අතර සම්බන්ධතාව ලියන්න. නලයේ ආනත කෝණය $e$ ලෙස ගන්න.

........................................................................................................................

........................................................................................................................

(iv) තවදුරටත් ජලය ඉවත් කරගෙන යනවිට වා කදේ දිග 46 cm වන විට නැවතත් තීව්‍ර ශබ්දයක් ඇසුනි. මෙම අවස්ථාවට අදාල තරංග ආයාමය ($\lambda$) හා වා කදේ දිග ($l$) අතර සම්බන්ධතාව ලියන්න.

........................................................................................................................

........................................................................................................................



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

මෙම තීරයේ කිසිවක් නො ලියන්න.

(v) ඉහත (iii) හා (iv) අවස්ථා සම්බන්ධ කර ගෙන වාතයේ ධ්වනි ප්‍රවේගය (V) හා නලයේ ආන්ත දෝෂය ($e$) ගණනය කරන්න.

............................................................................................................................

............................................................................................................................

............................................................................................................................

............................................................................................................................

............................................................................................................................

............................................................................................................................

22 A/L අපි [ papers group ]

(vi) මෙම පරීක්ෂණය සඳහා ජලය වෙනුවට මධ්‍යසාර භාවිතා කරන ලද නම් ඉහත (v)හි වාතයේ ධ්වනි ප්‍රවේගය ( $V$) සඳහා ලබා ගත් අගයම මෙහිදී ලැබේ ද නැද්ද ? පැහැදිලි කරන්න.

............................................................................................................................

............................................................................................................................

............................................................................................................................

(vii) (1) වාතයේ ධ්වනි ප්‍රවේගය ( $V$) සෙවීම සඳහා වඩාත් සාධාරණ ක්‍රමයක් ලෙස සරසුල් කාංඩයක් ගෙන පරීක්ෂණය කර ප්‍රස්තාර ක්‍රමය මෙහිදී යොදා ගැනීමට අදහස් කරයි. පොදුවේ ගත් කළ සංඛ්‍යාතය $f$ වන සරසුලේ මූලිකයට ලැබුණු කම්පන දිග ($l$) හා නලයේ ආන්ත දෝෂය $e$ විය. මෙහිදී ඔබ යොදාගන්නා $V$, $l$, $\lambda$ හා $e$ අතර සම්බන්ධය ලියන්න.

............................................................................................................................

............................................................................................................................

(2) ඉහත (1) හි ප්‍රකාශනය ප්‍රස්තාර ආකාරයට හරවන්න.

............................................................................................................................

............................................................................................................................

............................................................................................................................

(3) ප්‍රස්තාරයෙන් $V$ හා $e$ සොයන්නේ කෙසේ ද?

............................................................................................................................

............................................................................................................................

............................................................................................................................

**4.** කෝෂයක අභ්‍යන්තර ප්‍රතිරෝධය හා විද්‍යුත්ගාමක බලය සෙවීම සඳහා ධාරානියාමකයක්, 20Ω ක නියත ප්‍රතිරෝධයක්, ඇමීටරයක්, වෝල්ට්මීටරයක් හා අවශ්‍ය ප්‍රමාණයට වයර් සපයා ඇත්නම්,

($a$) පහත දී ඇති උපකරණ පරීක්ෂණයට සුදුසු පරිදි සකස් කරන්න.




($b$) කෝෂයේ අභ්‍යන්තර ප්‍රතිරෝධය $r$ ද ඇමීටරයේ පාඨාංකය ($I$) ද, වෝල්ට් මීටරයේ පාඨාංකය ( $V$) ද ලෙස ගෙන $I$ විචලනය කරමින් $V$ අගය මැනගෙන එමගින් සරල රේඛීය ප්‍රස්තාරයක් ඇඳීම සඳහා එය සකස් කරන්න.

............................................................................................................................

............................................................................................................................



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers  Model Answers - Study Resources
iexamhub

මෙම තීරයේ කිසිවක් නො ලියන්න.

(*c*) 20Ω ක නියත ප්‍රතිරෝධයක් පරිපථයට සම්බන්ධ කිරීමෙන් බලාපොරොත්තු වන්නේ කුමක් ද?

(*d*) ධාරා නියාමකය වෙනුවට ප්‍රතිරෝධ පෙට්ටියක් යොදාගත හැකි ද? හේතුව සහිතව දක්වන්න.

(*e*) ඉහත කෝෂයේ විද්‍යුත්ගාමක බලය සෙවීමට වෙනත් සිසුවෙකු කෝෂය, ප්‍රතිරෝධ පෙට්ටිය හා ඇමීටරය පමණක් යොදාගෙන කළ හැකි බව ප්‍රකාශ කරයි. එම ප්‍රකාශය නිවැරදි නම් ඒ සඳහා සුදුසු පරිපථයක් සුපුරුදු සංකේත මගින් ඇඳ දක්වන්න.

(*f*) ඉහත සකස් කළ පරිපථයේ ප්‍රතිරෝධ පෙට්ටියේ අගය වෙනස් කරමින් ඇමීටරයේ පාඨාංකය මැනීමට අදහස් කරයි නම් ඒ සඳහා අවශ්‍ය සිද්ධාන්තය ලියා සරල රේඛීය ප්‍රස්ථාරයක් සඳහා සමීකරණය සපයන්න.

(*g*) ප්‍රස්තාරය මගින් කෝෂයේ විද්‍යුත්ගාමක බලය හා කේෂයේ අභ්‍යන්තර ප්‍රතිරෝධය සොයන ආකාරය පැහැදිලි කරන්න.

(*h*) ඉහත ආකාරයේ පරීක්ෂණයේ දී ලද ප්‍රස්තාරයේ අනුක්‍රමණය $0.5\ A^{-1}\ \Omega^{-1}$ වන අතර අන්තඃ ඛණ්ඩය $0.5\ A^{-1}$ නම් කෝෂයේ විද්‍යුත්ගාමක බලය හා අභ්‍යන්තර ප්‍රතිරෝධය සොයන්න.

(*i*) ඉහත (*a*) හි සකස් කළ පරිපථය ඉතා සුළු වෙනස් කිරීමක් මගින් ඕම් නියමය සත්‍යාපනය කළ හැකිය. එම වෙනස් කිරීම සිදුකරන ආකාරය සුපුරුදු සංකේත මගින් පරිපථ සටහනක ඇඳ දක්වන්න.

22 A/L අපි [ papers group ]

(*j*) ඉහත පරිපථය මගින් ඕම් නියමය සනාථ කරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(*k*) ඉහත සනාථ කිරීම සිදු කිරීමේ දී ඇති උපකරණ වලට අමතරව තවත් එක් උපකරණයක් යොදාගැනීම මගින් පරීක්ෂණයේ නිවැරදිතාවය වැඩිකළ හැකි බව සිසුවෙකු පවසයි. එම උපකරණය කුමක්ද යන්න දක්වා එමගින් ඉවත්වන දෝෂය කුමක්දැයි හේතු සහිතව දක්වන්න.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved]

කො/ විශාඛා විද්‍යාලය - කොළඹ 05
Co / Visakha Vidyalaya, Colombo 05

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022
General Certificate of Education (Adv. Level) Examination, 2022

භෞතික විද්‍යාව II
Physics II

13 ශ්‍රේණිය Grade -13

01 S II

3 වන වාර පරීක්ෂණය - 2022, නොවැම්බර්
3rd Term Test - 2022, November

22 A/L අපි [papers group]

B කොටස – රචනා
ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.
(ගුරුත්වජ ත්වරණය, $g = 10\,\text{m s}^{-2}$ ලෙස සලකන්න.)

**5.** අපගේ එදිනෙදා ජීවිතයේ දී සියලුම ක්‍රියාකාරකම්, ඇවිදීම, බර එසවීම, ක්‍රීඩා කිරීම ආදී සියල්ල සඳහා මාංශ පේශීන්වලින් ඇති කරන බලය අවශ්‍ය වේ. මාංශ පේශීන්වලින් බලයක් ජනනය කිරීමට මාංශ පේශීන් ශක්තිමත් විය යුතුය. කෙනෙකුට එසවිය හැකි භාරය සහ යෙදිය හැකි බලය මගින් ඔහුගේ හෝ ඇයගේ මාංශ පේශීන්වල ශක්තිය නිර්ණය කළ හැක. ඔබට ශක්තිමත් මාංශ පේශීන් ඇත්නම් යම් කාර්යයක් වෙහෙසකින් සහ අනතුරකින් තොරව සිදු කර ගත හැක. ඕනෑම ක්‍රීඩකයකුගේ සාර්ථකත්වය රඳා පවතින්නේ ඔහුගේ මාංශ පේශීන්වල ශක්තිය මතය. පහත රූපසටහන් මගින් යම් යම් කාර්යයන් සඳහා ශරීරයේ විවිධ මාංශ පේශීන් උදවු වන ආකාරය විස්තර කෙරේ.

(*a*) යම් පුද්ගලයෙක් අතේ ඉදිරි භාහුව (forearm) මගින් ස්කන්ධය 4kg වන වස්තුවක් ඔසවා තබා ගෙන සිටින ආකාරය 1(*a*) රූපයේ පෙන්වා ඇත. ද්විශීර්ෂ පේශීන් (Bicep) ඉදිරි භාහු අස්ථියට ඍජුව සම්බන්ධ වී ඇති අතර එම අස්ථිය මත බලයක් ඇති කරයි. ඉදිරි භාහුවේ ස්කන්ධය 2.5kg වේ. එසවීමක දී ත්‍රිශීර්ෂ පේශීන් (tricep) ලිහිල් වී ඇති අතර එමගින් බලයක් ඇති නොකරයි. වැලමිට සන්ධියේ සිට ඉදිරි භාහුවේ ගුරුත්ව කේන්ද්‍රයට, භාරයේ ගුරුත්ව කේන්ද්‍රයට හා ද්වි ශීර්ෂ පේශියට දුර පිළිවෙලින් 16cm, 38cm සහ 4cm වේ.




1(*a*) රූපය




1(*b*) රූපය

(i) ඉදිරි භාහුව මත ක්‍රියාකරන බල 1(*b*) රූපයේ ලකුණු කරන්න.
(ii) සමතුලිතතාවය සඳහා අවශ්‍ය පොදු අවශ්‍යතාවයන් දෙක ලියන්න.
(iii) ද්වි ශීර්ෂ පේශීන් මගින් ඉදිරි භාහුව මත ඇති කරන බලය සොයන්න.
(iv) වැලමිට සන්ධිය මත ඇතිවන ප්‍රතික්‍රියාව සොයන්න.
(v) ඉදිරි භාහුව තිරසට θ කෝණයක් ආනතව පහලට ඇති විට ද්විශීර්ෂ පේශිය මගින් ඇති කරන බලය කුමක් ද?


www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

(vi) ද්විශිර්ෂ පේශිය මගින් ඇතිකරන බලය θ සමග වෙනස් වන ආකාරය ප්‍රස්තාරිකව ඇඳ දක්වන්න.

(vii) ද්විශිර්ෂ පේශීන් මගින් යෙදිය හැකි උපරිම බලය 1000N කි.

1. 20kg භාරයක් මෙම පුද්ගලයාට තනි අතකින් එසවිය හැකි ද? අවශ්‍ය ගණනය කිරීම් සහිතව පැහැදිලි කරන්න.

2. පේශීන්වල ඝණත්වය පේශීන් මගින් ඇති කළ හැකි බලයට අනුලෝමව සමානුපාතික වේ. මෙම පුද්ගලයාගේ ද්වි ශිර්ෂ පේශිවල ඝනත්වය 1200 $kgm^{-3}$ වේ. 30kg භාරයක් තනි අතකින් එසවීමට අවශ්‍ය පේශිවල ඝනත්වය සොයවන්න.

3. පේශි ඝනත්වය වැඩි කරගන්නා ක්‍රම දෙකක් ලියන්න.

(*b*) ස්කන්ධය 75kg වන බැඩ්මින්ටන් ක්‍රීඩකයෙකු රූපයේ ආකාරයට පාදවල විලුඹෙන් සිටගෙන සමතුලිතව සිටී. මෙවිට කේන්ඩ පේශීන් (calf muscle) මගින් පාද මත බලයක් ඇති කරයි. විලුඹ සහ වලලුකර සන්ධිය යාකරන රේඛාවට ලම්භකව කේන්ඩ පේශීන් මගින් බලය ඇති කරයි. පාදය තිරසට $30^{o}$ ආනතව පවතී. පොළවෙන් ඇතිවන ඝර්ෂණ බලය හා පාදයේ ස්කන්ධය නොසලකා හරින්න.




2(*a*) රූපය




2(*b*) රූපය

22 A/L අපි [ papers group ]

වළලුකර සන්ධියේ සිට විලුඹට සහ කෙණ්ඩ පේශීන්ට ඇති ලම්භක දුර පිළිවෙලින් 16cm සහ 4.5cm වේ.

(i) පාද මත ඇතිවන බල 2(*b*) රූපයේ ලකුණු කරන්න.

(ii) පාද දෙක මත පොළොවෙන් ඇතිවන ප්‍රතික්‍රියා බලය කොපමණ ද?

(iii) කෙණ්ඩ පේශි මගින් පාද දෙක මත ඇති වන බලය සොයන්න. මෙම බලය ඔහුගේ බර සමග සන්සන්දනය කරන්න.

(iv) එක් වළලුකර සන්ධියක් මත ක්‍රියා කරන ප්‍රතික්‍රියා බලයේ විශාලත්වය සහ දිශාව සොයන්න.

(vi) බැඩ්මින්ටන් ක්‍රීඩකයා වේග පහරක් (smash) එල්ල කිරීම සඳහා සිරස්ව ඉහළට උඩ පනී. පොළොවෙන් නික්මෙන මොහොතේ දී ඔහුගේ පාද 2(*a*) රූපයේ පරිදි තිරසට $30^{o}$ ආනතව පවතී. මෙම පැනීමේ දී පොළොවෙන් ඇතිවන ප්‍රතික්‍රියා බලය කාලය සමග වෙනස් වන ආකාරය පහත ප්‍රස්ථාරයේ දක්වා ඇත.




(1) ඔහු පොළොවෙන් එසවෙන ප්‍රවේගය සොයන්න.

(2) මෙම කාලය තුළ කෙන්ඩ පේශීන් ජනනය කරන උපරිම බලය සොයන්න. මෙම බලය ඉහත (iii) කොටසේ දී ලබාගත් අගය සමග සන්සන්දනය කරන්න.

(3) දී ඇති කාලය තුළ පාදයේ කෝණික ත්වරණය සොයන්න.

**6.** (*a*) මිනිස් ඇස මිනිස් සිරුරෙහි අංගයක් වන අතර එය දෘෂ්ටිය පිළිබඳ සංවේදනය ලබාදෙයි. ඇසෙහි ප්‍රධානතම උපාංග අක්ෂි කාචයයි. ඇසෙන් නරඹනු ලබන වස්තූන්ගේ වස්තු දුර විශාල පරාසයක් තුළ වෙනස්විය හැකි වුවද අක්ෂි කාචය සහ දෘෂ්ටිවිතානය අතර ප්‍රතිබිම්බ දුර නියතයක් (අක්ෂි ගෝලයේ විෂ්කම්භය 2.5cm) වන නිසා ප්‍රතිබිම්භය නිසි පරිදි දෘෂ්ටිවිතානය මත නාභිගත කිරීම සඳහා කාචයේ නාභිදුර අදාළ පරිදි සීරුමාරු කළ යුතුය. දෘෂ්ටි දෝෂ නොමැති පුද්ගලයකුගේ විශද දෘෂ්ටියෙහි අවම දුර 25cm කි.

(i) වස්තුව අවිදුර ලක්ෂ්‍යයේ සහ දුර ලක්ෂ්‍යයේ ඇති විට නිරෝගී ඇසකට ප්‍රතිබිම්බ නාභිගත කිරීමට අදාළ කිරණ රූපසටහන් අඳින්න.

(ii) අවිදුර දෘෂ්ටිකත්වය හා දුර දෘෂ්ටිකත්වය කෙටියෙන් හඳුන්වන්න.

(*b*) දුර දෘෂ්ටිකත්වය සහ අවිදුර දෘෂ්ටිකත්වය යන රෝගී තත්ත්වයන් දෙකෙන්ම පෙලෙන පුද්ගලයකුගේ දෘෂ්ටි පරාසය 50cm සහ 500cm වේ. ඉහත පුද්ගලයා එම දෝෂ දෙකම වලක්වාගැනීමට තනි කණ්නාඩියක් භාවිතා කිරීමට අදහස් කරයි. එවැනි කණ්නාඩියක ඉහළ කොටස දුර බැලීමට ද පහළ කොටස ලඟ බැලීමට ද හැකිවන ආකාරයට නිර්මාණය කරනු ලැබේ.

(i) ඉහත කාචයේ ඉහළ කොටසට හා පහළ කොටසට අදාල කාචයේ බලයන් සොයන්න.

(ii) කණ්නාඩිය නොපළඳින විට මේ තැනැත්තා ඇස ඉදිරියේ 30cm දුරින් 2cm උස වස්තුවෙහි ප්‍රතිබිම්බයේ ඇතිවීම දක්වන කිරණ සටහන අඳින්න.

(iii) (ii) හි වස්තුව මගින් ඇසේ ආපාතිත කෝණය රේඩියන (rad) වලින් සොයන්න.

(iv) නිරෝගී පුද්ගලයකුගේ ඇසට 25cm ක් දුරින් ඇති 2cm ක් උස වස්තුවක් මගින් දෘෂ්ටිවිතානයේ ඇති වන ප්‍රතිබිම්බයේ උස සොයන්න.

(v) රෝගී තැනැත්තාට සාපේක්ෂව නිරෝගී තැනැත්තාට පියවි ඇසින් වැඩි විශාලනයකින් යුතුව වස්තූන්හි ප්‍රතිබිම්බය දැකගත හැකි බව සිසුවෙක් ප්‍රකාශ කරයි. මේ සමග ඔබ එකඟ වන්නේ ද? පැහැදිලි කරන්න.

(*c*) නිරෝගී පුද්ගලයෙකුට නාභිදුර 2cm සහ 5cm වන කාච සහිත සංයුක්ත අණ්වීක්ෂයකින් ක්ෂුද්‍ර ජීවියෙකු නිරීක්ෂණය කරමින් සිටී. රෝගී පුද්ගලයා කණ්නාඩිය නොපැළඳ අණ්වීක්ෂය තුළින් බැලූවිට එම ක්ෂුද්‍ර ජීවියා නොපෙනෙන බව ප්‍රකාශ කරයි.

(i) සංයුක්ත අණ්වීක්ෂය සාමාන්‍ය සීරුමාරුවේ ඇති විට නිරෝගී තැනැත්තා ක්ෂුද්‍ර ජීවියා නිරීක්ෂණය කිරීම විදහා දක්වන කිරණ සටහන අඳින්න.

(ii) රෝගී තැනැත්තා ක්ෂුද්‍ර ජීවියා දැක ගැනීමට උපනෙත චලිත කළ යුතු දිශාව සහ දුර සොයන්න.

(iii) රෝගී තැනැත්තාට අදාළ සංයුක්ත අණ්වීක්ෂයේ කෝණික විශාලනය සොයන්න. (අවනෙත සඳහා ප්‍රතිබිම්බ දුර 12cm ක් වේ.)

22 A/L අපි [ papers group ]

**7.** රූපයේ දැක්වෙන්නේ පැවතිය හැකි සියළු ප්‍රත්‍යාබල අගයන් සඳහා යම් ද්‍රව්‍යයක් සඳහා ලබාගත්, වික්‍රියාව ($e/l$) එදිරියෙන් ප්‍රත්‍යාබල ($F/A$) වක්‍රයයි.




(*a*) (i) වක්‍රය මත ඇති $A$ හා $B$ ලක්ෂ්‍ය හඳුන්වන්න.

(ii) එම ද්‍රව්‍යයේ යං මාපාංකය ගණනය කරන්න.

(iv) වික්‍රියාව $2 \times 10^{-4}$ වන විට ඒකක පරිමාවක ගබඩා වී ඇති ශක්තිය ගණනය කරන්න.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources




(*b*) ඉහත ද්‍රව්‍යයෙන් සාදන ලද පැත්තක දිග 25cm වන සමචතුරස්‍රාකාර හරස්කඩක් හා දිග 12m වන සර්වසම කණු හතරක් භාවිතා කර පතුලේ අභ්‍යන්තර දිග හා පළල 2m වන පතුල සමචතුරස්‍රාකාර වන වතුර ටැංකියක් රූපයේ පරිදි තබා ඇත. ටැංකියේ අභ්‍යන්තර උස 2.25m වන අතර එහි ස්කන්ධය 1000kg වේ. (රූපය පරිමාණයට ඇඳ නැත.) හිස් ටැංකිය පමණක් කණු මත ඇති විට,

(i) එක් කණුවක ඇතිවන විතතිය සොයන්න.

(ii) එවිට වික්‍රියාව කොපමණ ද?

(iii) මෙම අවස්ථාවේ කණු හතරෙහිම ගබඩා වී ඇති වික්‍රියා ශක්තිය ගණනය කරන්න.

(*c*) දැන් ටැංකිය ඝනත්වය 1000 $kgm^{-3}$ වන ජලයෙන් සම්පූර්ණයෙන් පිරී ඇති අවස්ථාවක් සලකන්න.

(i) ටැංකිය තුළ ඇති ජලයේ බර ගණනය කරන්න.

(ii) එවිට එක් කණුවක වික්‍රියාව සොයා එය වක්‍රය මත $A$ ලක්ෂ්‍යයට අනුරූප වන බව පෙන්වන්න.

(iii) කණු පළුදුවීමකින් තොරව එම කණු හතර මත ඉහත පරිදි තැබිය හැකි ජලය සහිත ටැංකියක උපරිම බර සොයන්න.

(iv) ටැංකියට පුරවන ලද ජලයේ උස ($h$) සමග කණුවක ඇතිවන විතතිය (e) විචලනය වන ආකාරය ප්‍රස්තාරගත කරන්න.

(*d*) සමචතුරස්‍රාකාර හරස්කඩ සහිත කණු හතර වෙනුවට වෘත්තාකාර හරස්කඩක් සහිත තනි කණුවක් භාවිතා කරයි නම් ඉහත පරිදි භාරයන් දරා සිටීමට

(i) අවශ්‍ය වන එම කණුවේ අරය සොයන්න.

(ii) එය පතුළ මත තැබිය යුත්තේ කුමන පිහිටුමක ද?

(iii) තනි කණුවක් භාවිතා කිරීමෙන් ඇති වන වාසියක් සඳහන් කරන්න.

22 A/L අපි [ papers group ]

8. අභ්‍යවකාශ ගවේෂණ සමාගමක් විසින් ස්කන්ධය 9000 kg ක් වන අභ්‍යවකාශ පරීක්ෂණාගාරයක් ස්ථාපිත කිරීමට සැලසුම් කරයි. ඒ සඳහා පෘථිවි පෘෂ්ඨයේ සිට 2600 km ක උසකට පරීක්ෂණාගාරය රැගෙන ගොස් ස්ථාපිත කළ යුතුව ඇත. අභ්‍යවකාශ පරීක්ෂණාගාරයේ සිට තවත් 500 km ක උසකින්



තොරතුරු එක්රැස් කිරීම සඳහා 50kg ක ස්කන්ධයක් සහිත විශේෂිත උපකරණයක් ද ස්ථාපිත කිරීමට නියමිත ව ඇත. රූපයේ පෙන්වා ඇති පරිදි පරීක්ෂණාගාරය හා විශේෂිත උපකරණය පෘථිවිය වටා වෘත්තාකාර කක්ෂවල නියත වේගවලින් ගමන් කරන බව උපකල්පනය කරන්න. පරීක්ෂණාගාරය හා විශේෂිත උපකරණය අතර ඇතිවන ආකර්ශන බල නොසලකා හරින්න.

(*a*) පෘථිවියේ ස්කන්ධය $M$ ද අරය $R$ ද නම් පෘථිවි කේන්ද්‍රයේ සිට අරය $r$ වන වෘත්තාකාර කක්ෂයක ගමන් කරන ස්කන්ධය $m$ වන වස්තුවක,

(i) ගුරුත්වජ විභවය ශක්තිය

(ii) එම ස්ථානයේ ගුරුත්වාකර්ෂණ ක්ෂේත්‍ර තීව්‍රතාව සඳහා ප්‍රකාශනය ලියන්න.

(*b*) (i) පෘථිවියේ අරය 6400 km හා පෘථිවි පෘෂ්ඨය මත දී ගුරුත්වාකර්ශන ක්ෂේත්‍ර තීව්‍රතාව 10 $Nkg^{-1}$ නම් පරීක්ෂණාගාරයේ වේගය කොපමණ විය යුතු ද? ($\sqrt{10} \approx 3.15$ ලෙස ගන්න.)

(ii) ඉහත උපකරණ දෙකම හා සියලුම ආම්පන්න සහිතව මුළු ස්කන්ධය $10^4$kg වන අභ්‍යවකාශ යානයක් පෘථිවියේ සිට පරීක්ෂණාගාරය ස්ථාපිත කළ යුතු කක්ෂය වෙත යන්තමින් යැවීමට සැපයිය යුතු ශක්තිය කොපමණ ද? (වාත ප්‍රතිරෝධය නොසලකා හරින්න.)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(iii) මෙම පිහිටුමේ දී අභ්‍යවකාශයානය සතු මුළු විභව ශක්තිය කොපමණ වේ ද?

(iv) පළමු කක්ෂයේ පරීක්ෂණාගාරය ස්ථාපිත කර දෙවන කක්ෂය වෙත විශේෂිත උපකරණය ගෙන යාමට අවශ්‍ය අමතර ශක්තිය සොයන්න.

(*c*) මෙලෙස පරීක්ෂණාගාරය හා විශේෂිත උපකරණය ස්ථාපිත කළ පසු මුළු ස්කන්ධය 100 kg වන වෙනත් යානයක් මගින් පරීක්ෂණාගාර උපකරණ තොගය පරීක්ෂණාගාරය වෙත පෘථිවියේ සිට ගෙන යා යුතු ව ඇත.

(i) පරීක්ෂණාගාරය වෙත උපකරණ තොගය ගෙන යාමේ දී යානයේ කිසිදු ශක්ති හානියක් සිදු නොවන්නේ නම්, පරීක්ෂණාගාර කක්ෂය වෙනස් නොකර එම කක්ෂයේ සිට උපකරණ තොගය පරීක්ෂණාගාරය වෙත ලබාදීමට යානය පරීක්ෂණාගාරය වෙත සම්බන්ධ වීමට අවශ්‍ය අමතර අවම ශක්තිය කොපමණ ද?

(ii) යානය පරීක්ෂණාගාරයට සම්බන්ධ වූ පසු යානයේ ඇති උපකරණ තොගය පරීක්ෂණාගාරයට සංක්‍රමණය කළ යුතුව ඇත. මෙම භාණ්ඩ පැටවීම නිසා පරීක්ෂණාගාරයේ වේගය වෙනස් වේ ද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

(iv) පෘථිවි පෘෂ්ඨයේ සිට වියෝග ප්‍රවේගයෙන් ප්‍රක්ෂේපණය කළ වස්තුවක් පරීක්ෂණාගාර මට්ටමට පැමිණෙන විට අත්කර ගන්නා වේගය කුමක් ද? ($\sqrt{5} \approx 2.25$ ලෙස සලකන්න.)

**9. A.** දිග 100 cm ක් වන කම්බියේ ප්‍රතිරෝධය 10 Ω ක් වන $AB$ විභවමාන කම්බියකට $R$ ප්‍රතිරෝධකයක් ශ්‍රේණිගතව සවිකර එයට විභවය සැපයීමට 2V ක කෝෂයක් සම්බන්ධ කර ඇත. ඉහත විභවමානය මගින් 10mV ක වෙනත් කෝෂයක් විභවමාන කම්බියේ 40 cm දිගකින් සංතුලනය වේ.




(*a*) $R$ ප්‍රතිරෝධයේ අගය සොයන්න.

(*b*) $AB$ විභවමාන කම්බියේ ඒකක දිගක විභව බැස්ම කොපමණ ද?

(*c*) ඉහත විභවමානය කාලයක් භාවිතා කිරීමේ දී කම්බියේ කොටසක් සීරීම නිසා දෝෂයක් පෙන්නුම් කරයි. සීරීම ඇති ප්‍රදේශය පරීක්ෂණාත්මකව සොයා ගැනීම සඳහා පරිපූර්ණ වෝල්ට් මීටරයක් මගින් විභවමාන කම්බියේ එක් එක් දුරවල්වලදී විභව අන්තරය මැන ඒවා දුර සමග ප්‍රස්ථාරගත කළ විට පහත ආකාරයේ ප්‍රස්ථාරයක් ලැබේ.




22 A/L අපි [ papers group ]

(i) ඉහත ප්‍රස්තාරය අධ්‍යයනය කර සීරීම ඇති ප්‍රදේශය හේතු සහිතව දක්වන්න.

(ii) සීරීම නොමැති ප්‍රදේශයේ ඒකක දිගක ප්‍රතිරෝධය $8\Omega m^{-1}$ නම් ඒකක දිගක විභව බැස්ම සොයන්න.

(iii) සීරීමකට ලක්වූ ප්‍රදේශයේ මධ්‍යන්‍ය ප්‍රතිරෝධය 1.2Ω නම් කම්බිය දිගේ ගලන ධාරාව කොපමණ ද?

(iv) සීරීමට ලක්වී ඇති ප්‍රදේශයේ උපරිම විභව අනුක්‍රමණය කොපමණ ද?

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
[දාහතරවැනි පිටුව බලන්න

(*d*) විදුලිජනක යන්ත්‍රයක් මගින් ක්‍රියාත්මක වන සැනලිපහන් කිහිපයක් සම්බන්ධ කර ඇත. එක් සැනලි පහනක 100V/50W ලෙස සටහන් කර ඇති අතර එවැනි සර්වසම පහන් හතරක් විදුලි ජනක යන්ත්‍රයට උපරිම දීප්තියෙන් දැල්වෙන පරිදි සම්බන්ධ කර ඇත. විදුලි ජනක යන්ත්‍රය 50Ω ක අභ්‍යන්තර ප්‍රතිරෝධයක් පෙන්නුම් කරයි.

(i) විදුලි ජනකයේ අවම ප්‍රතිදාන විභව අන්තරය කොපමණ ද?

(ii) විදුලි ජනක යන්ත්‍රය 1000W ක ක්ෂමතාවයක් ඇත්නම් ඉහත ආකාරයේ පහන් කීයක් උපරිම වශයෙන් සම්බන්ධ කළ හැකි ද?

(iii) එක් එක් සැනලි පහන් ක්‍රියාත්මක ප්‍රතිරෝධය කොපමණ ද?

(*e*) විදුලිජනක යන්ත්‍රයෙන් සාමාන්‍යයෙන් ප්‍රත්‍යාවර්ථ ධාරාවක් උත්පාදනය කරන අතර ඒවා ඉලෙක්ට්‍රොනික පරිපථවලට ලබාදීමේ දී වෙනම පරිපථයක් මගින් සරල ධාරා තත්වයට පත් කරයි. $\sqrt{2} = 1.4$ ලෙස ගෙන

(i) ජනක යන්ත්‍ර මගින් උත්පාදනය කරන ප්‍රත්‍යාවර්ථ ධාරාවේ උච්ච වෝල්ටීයතාවය කොපමණ ද?

(ii) විදුලි ජනකය ඉහත ක්‍රියාත්මක තත්වයේ දී උච්ච ධාරාව ගණනය කරන්න.

(iii) ඉහත විදුලි ජනකයේ දඟරය ඉතා තදින් එක මත එක ස්පර්ශ වන පරිදි ඔතා පරිනාලිකාවක් නිර්මාණය කරන අතර එමගින් $30.24 \times 10^{-3}$ T චුම්භක ස්‍රාව ඝනත්වයක් ජනනය කරයි. $\pi = 3$ ලෙස ගෙන,

1. දඟරයේ ඒකක දිගක ඇති පොටවල් ගණන සොයන්න.
2. පරිනාලිකාව සඳහා භාවිත කළ තඹ කම්බියේ විෂ්කම්භය කොපමණ ද?

**9. B.** (*a*) NPN සිලිකන් ට්‍රාන්සිස්ටරයක් පාදම ප්‍රතිරෝධක ක්‍රමයට නැඹුරු කොට ඇත. (පෙර නැඹුරු විභවය 0.7V) යොදා ඇති ට්‍රාන්සිස්ටරයෙහි ධාරා ලාභය 200 කි. ට්‍රාන්සිස්ටරය නොදැනීම ක්‍රියාකාරී පරාසයකට තල්ලු කරන විට $V_{CE} = 0.5V_{CC}$ ලෙස ගන්න. $V_{BE} = 0.7V$




(i) $I_C$ ගණනය කරන්න.

(i) $I_B$ ගණනය කරන්න.

(iii) පාදම ප්‍රතිරෝධකය $R_B$ ගණනය කරන්න.

22 A/L අපි [ papers group ]

(*b*) ධාරා ලාභය β වන ට්‍රාන්ස්සිස්ටරයක පාදම ප්‍රතිරෝධය $R_B$ සංග්‍රාහක ප්‍රතිරෝධය $R_C$ විමෝචක ප්‍රතිරෝධය $R_E$ සැපයුම් විභවය V පාදම සන්ධියේ විභවය $V_B$ ද විට ඒ සඳහා යොදා ඇති පරිපථය පහත දැක්වේ. ක්‍රියාකාරී පරාසයේ ට්‍රාන්ස්සිස්ටරය ක්‍රියා කරන විට $V_{CE} = \frac{V_{cc}}{2}$ පාදම් ධාරාව $I_B$ ලෙස ගන්න.




(i) සංග්‍රාහක ධාරාව සඳහා ප්‍රකාශනයක් ලියන්න.

(v) $R_C$ විභව අන්තරය කොපමණ ද?

(iii) $R_E$ විමෝචකයේ විභව අන්තරය කොපමණ ද?

(iv) $I_B = \frac{V}{2(\beta R_C + (1+\beta) R_E}$ බව පෙන්වන්න.

(*c*) දී ඇති පරිපථය *A* සහ *B* සඳහා 0V හෝ 5V වෝල්ටීයතා සැපයිය හැක.




(i) *A* සහ *B* හි සියලුම අවස්ථා සඳහා *F* හි වෝල්ටීයතාවන් සොයා එය වගුවක දක්වන්න.

(ii) මෙය කුමන වර්ගයේ ද්වාරයක් ලෙස ක්‍රියාකරයි ද යන්න සත්‍යතා වගුවක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

A/L අපි [ papers group ]

(*c*) රූපයේ පෙන්වා ඇති ක්ෂේත්‍ර ආවරණ ට්‍රාන්සිස්ටරයක් යෙදූ පරිපථයේ $V_{GS} = -2.2V$ ද $V_{DS} = \frac{V_{DD}}{2}$ ද වන පරිදි සැලසුම් කොට ඇත. $I_D = 5mA$ වේ නම්, $R_S$ සහ $R_D$ ගණනය කරන්න.




(*d*) එක්තරා රසායන ද්‍රව්‍ය කර්මාන්ත ශාලාවක රසායනික දියරයක් එහි නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදා ගැනේ. මෙම රසායනික දියරය ටැංකි තුනක ගබඩා කර ඇත. එම එක් එක් ටැංකියට සවිකර ඇති දියර මට්ටම් සංවේදකයක් මගින් ඕනෑම ටැංකියක රසායන දියර මට්ටම 25% ට වඩා අඩු වූ විට තාර්කික (1) සංඥාව නිපදවයි. මින් ඕනෑම ටැංකි දෙකක් රසායන දියර මට්ටම 25% ට වඩා අඩු වූ විට අනතුරු ඇඟවීමේ රතු බල්බයක් (LED එකක්) දැල්වීම සඳහා තාර්කික පරිපථයක් නිර්මාණය කරන්න. මෙහිදී LED එක දැල්වීම සඳහා ඔබ නිර්මාණය කරනු ලබන පරිපථයේ ප්‍රතිදානය ලෙස තාර්කික (1) නිපදවිය යුතු බව සලකන්න.

**10. A.** (*a*) වායු පිළිබඳ චාලක අණුක වාදයේ දැක්වෙන සමීකරණය ලියා එහි පද හඳුන්වන්න. ඒ ඇසුරින් වායු අණුවක මධ්‍යන්‍ය චාලක ශක්තිය $E = \frac{3}{2}KT$ බව පෙන්වන්න. K - බෝල්ට්ස්මාන් නියතය

(*b*) "පරිපූර්ණ වායුවක අභ්‍යන්තර ශක්තිය එහි චාලක ශක්තියට සමාන වේ." පැහැදිලි කරන්න.

(*c*) 27°C උෂ්ණත්වයේ පවතින $N_2$ වායු සාම්පලයක් $2 \times 10^5$ Pa පීඩනයක් යටතේ $2.5 \times 10^{-2}$ $m^3$ සංවෘත පරිමාවක් තුළ පවතී. $N_2$ හි සාපේක්ෂ අණුක ස්කන්ධය 28 සාර්වත්‍ර වායු නියතය $8.3\,J mol^{-1} K^{-1}$

(i) භාජනය තුළ $N_2$ වායු මවුල දෙකක් අඩංගු බව ගණනය කිරීමෙන් පෙන්වන්න. මෙහිදී ඔබ යොදා ගන්නා එක් උපකල්පනයක් සඳහන් කරන්න.
(සුළු කිරීමේ දී $8.3 = {}^{25}/_{3}$ ලෙස භාවිතා කරන්න.)

(ii) වායුව සමෝෂ්ණ තත්ව යටතේ ප්‍රසාරණය කිරීමෙන් එහි පරිමාව $3.75 \times 10^{-2}$ $m^3$ ප්‍රමාණයකින් වැඩි කරන ලදී. එයට අනුරූපව වායුවේ පීඩනය කොපමණ ප්‍රමාණයකින් අඩුවේ ද?

(iii) ඉහත සඳහන් අවස්ථා දෙකට අනුරූප වායුවේ පරිමාව සමග පීඩනයේ විචලනය ප්‍රස්තාරයක දක්වන්න. *X* හා *Y* අක්ෂවල අදාළ අගයයන් සලකුණු කරන්න.

(iv) වායුව එකවර සමෝෂ්ණ ලෙස ප්‍රසාරණය නොකර පළමුව නියත පීඩනයේ දී ප්‍රසාරණය කර (*A* ක්‍රියාවලිය) අනතුරුව නියත පරිමාවේ දී පීඩනය අඩු කර (*B* ක්‍රියාවලිය) *c* (ii) හි සඳහන් අවස්ථාවට පත් කරන ලදී.




I. මෙහි *x* අතරමැදි අවස්ථාවට අදාළ වායුවේ උෂ්ණත්වය කොපමණ ද?

II. *A* හා *B* ට අදාළ ව පහත දෑ ගණනය කරන්න.
1. අභ්‍යන්තර ශක්ති වෙනස් වීම පිළිවෙලින් $\Delta U_A$ සහ $\Delta U_B$
2. වායුව මගින් සිදු කළ කාර්යය පිළිවෙලින් $\Delta W_A$ සහ $\Delta W_B$
3. වායුවට ලබා දුන් තාප ප්‍රමාණය පිළිවෙලින් $\Delta Q_A$ සහ $\Delta Q_B$

III. *A* හා *B* ක්‍රියාවලින් දෙක සලකමින් වායුවේ නියත පීඩනයේ දී විශිෂ්ට තාප ධාරිතාව (Cp) සහ නියත පරිමාවේ දී විශිෂ්ට තාප ධාරිතාව (Cv) ගණනය කරන්න.

IV. මෙම පරිපූර්ණ වායුව සඳහා $\gamma = 1.67$ බව ගණනය කර පෙන්වන්න.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

[දහසයවැනි පිටුව බලන්න

**10. B.** (*a*) ප්‍රකාශ විද්‍යුත් ආවරණය යනු කුමක් දැයි පැහැදිලි කර දේහලීය තරංග ආයාමය, කාර්ය ශ්‍රිතය හා නැවතුම් විභවය යන පද හඳුන්වන්න.

(*b*) (i) අයින්ස්ටයින්ගේ ප්‍රකාශ විද්‍යුත් සමීකරණය ලියා පද හඳුන්වන්න.

(ii) නැවතුම් විභවය ඇතුළත් කර ඉහත සමීකරණය නැවත සකස් කරන්න.

(*c*) රූපයේ දැක්වෙන පරිපථය භාවිතා කර ප්‍රකාශ කෝෂයක් සමග පරීක්ෂණයක් සිදු කරන ලදී. මෙහි $P$ යනු විචල්‍ය වෝල්ටීයතා ප්‍රභවයයි.
භාවිතා කරන ආලෝක තීව්‍රතාවය සහ සංඛ්‍යාතය විචලනය කරමින් V විභව අන්තරය සමග ප්‍රකාශ ධාරාවේ $A$, $B$, $C$, $D$ හා $E$ වක්‍ර 5ක් පහත රූපයේ පෙන්වා ඇති පරිදි ලබාගන්නා ලදී.







22 A/L අපි [ papers group ]

(i) එකම සංඛ්‍යාතය නමුත් වෙනස් තීව්‍රතා සහිත පතිත ආලෝකය නිරූපණය කරන්නේ කුමන වක්‍ර මගින් ද? එම තෝරා ගැනීමට හේතුව දෙන්න.

(ii) භාවිතා කරන ආලෝකයේ ඉහළම තීව්‍රතාවය නිරූපණය කරන්නේ කුමන වක්‍රයෙන් ද? එම තෝරා ගැනීමට හේතුව දෙන්න.

(iii) භාවිතා කරන ආලෝකයේ පහළම තීව්‍රතාවය නිරූපණය කරන්නේ කුමන වක්‍රයෙන් ද? එම තෝරාගැනීමට හේතුව දෙන්න.

(iv) ප්‍රකාශ විද්‍යුත් පෘෂ්ඨයෙන් විමෝචනය වන ඉලෙක්ට්‍රෝනවල ඉහළම චාලක ශක්තියට අනුරූප වන වක්‍රය කුමක් ද?

(*d*) ආගන් ලේසර් කදම්බය තරංග ආයාමය $4.88 \times 10^{-7}$ m වන ආලෝක කදම්බ නිකුත් කරන අතර කදම්බයේ ක්ෂමතාව 100 mW වේ. දේහලීය සංඛ්‍යාතය $5.2 \times 10^{14}$ Hz වන සීසියම් කැතෝඩය මතට මෙම ආලෝක කදම්බය පතනය වීමට සලස්වනු ලැබේ. ප්ලාන්ක් නියතය $6.6 \times 10^{-34}$ Js ද ආලෝකයේ වේගය $3 \times 10^{8}$ ms$^{-1}$ ද සහ ඉලෙක්ට්‍රෝනයක ආරෝපණය $1.6 \times 10^{-19}$ C වේ.

(i) ලේසර් කදම්බය මගින් තත්පරයක දී නිකුත් කරන ෆෝටෝන ගණන සොයන්න.

(ii) පතිත වන ෆෝටෝනවලින් 10% ක් ඉලෙක්ට්‍රෝන මුදාහැරීම සඳහා දායක වන්නේ යැයි උපකල්පනය කර ප්‍රකාශ විද්‍යුත් ධාරාව සොයන්න.

(iii) විමෝචනය වන ඉලෙක්ට්‍රෝන සඳහා නැවතුම් විභවය ගණනය කරන්න.

(*e*) (i) ඉලෙක්ට්‍රෝන වෝල්ට් යන්න අර්ථ දක්වන්න.

(ii) ඉලෙක්ට්‍රෝනයක් 2000V විභව අන්තරයක් හරහා නිසලතාවයේ සිට ත්වරණය කරයි නම් ලබාගන්නා චාලක ශක්තිය eV වලින් සොයන්න.

(iii) $Fe^{2+}$ අයනයක් නිසලතාවයේ සිට ඉහත විභව අන්තරය හරහා ත්වරණය කරයි නම් ලබාගන්නා චාලක ශක්තිය ජූල්වලින් සොයන්න.
(1eV = $1.602 \times 10^{-19}$ J, ඉලෙක්ට්‍රෝනයේ ස්කන්ධය = $9.11 \times 10^{-31}$ kg)

(iv) α අංශුවක් ගමන් කරන විට එහි චාලක ශක්තිය 4μeV වේ නම් චලිත වන වේගය සොයන්න.
(α අංශුවේ ආරෝපණය = $1.6 \times 10^{-14}$ C α අංශුවේ ස්කන්ධය $6.4 \times 10^{-27}$ kg)

* * *